Article 12(1).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019 - 01 - 03 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය :

01. ආර්. තාජුර්දීන් මහතා. – HRC/AP/475/2017
හැලඹගස්වැව, ගම්බිරිස්ගස්වැව,
අනුරාධපුර.

02. එච්.එම්. සමන්ති කුමාරි මිය.
අංක : 407 ගම්මානය,
මීගස්සෑගම, කිරලෝගම.

03. එච්.එම්. සුජාතා දයානි හේරත් මිය.
මීමල්වැව, කල්ලංචිය,
අනුරාධපුර.

04. ආර්.ජේ. සුසන්ත හේමරත්න මහතා,
යාය 07,කටියාව,
එප්පාවල.

(02 – 04) – HRC/AP/498/2017

වගඋත්තරකරුවන් :

01. ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරුමැද පළාත, අනුරාධපුරය.

02. ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය,
උතුරුමැද පළාත, අනුරාධපුරය.

පැමිණිලි අංකය : **HRC/AP/475/17 (S), HRC/AP/498/17 (I)**



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිල්ල :-

ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ඩිප්ලෝමාධාරීන්ගෙන් සහ උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන ලද බවත්, එහි වයස් සීමාව අවුරුදු 35 ක් වූ බවත්ය.

එමෙන්ම, ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ ඉහත සඳහන් වයස් සීමාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැසට් නිවේදනයක් මගින් සංශෝධනය කළ බවත්, එම සංශෝධනය මගින් 2017.01.23 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු බවට සඳහන් වූ බවත්, මෙම සංශෝධනය ඉංග්‍රීසි පිළිබඳ ජාතික ඩිප්ලෝමාධාරීන් HNDE සඳහා පමණක් කර ඇති බවත් සඳහන් කර ඇත.

උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ පළමු ගැසට් නිවේදනයේ සඳහන් වයස් සීමාව වන අවුරුදු 35 සංශෝධනය කිරීමේදී සියළුම උපාධිධාරීන්ට එය බලපැවැත්වෙන පරිදි සංශෝධනයක් සිදු නොකර HNDE ඩිප්ලෝමාධාරීන් සඳහා පමණක් වයස සංශෝධනය කිරීමෙන් බලවත් අසාධාරණයක් සිදුවූ බවත්, එකම තරඟ විභාගයකට පෙනීසිටි අයදුම්කරුවන්ට දෙයාකාරයකට වයස සලකා බැලීමෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවී ඇති බවත් සඳහන් කර ඇති අතර, මේ පිළිබඳව සොයා බලා සාධාරණයක් ඉටු කර දෙන ලෙසට මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකරුගේ ප්‍රකාශය :-

වගඋත්තර පාර්ශවය මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය 2017.03.18 දින පවත්වන ලද බවත්, පැමිණිලිකරුවන් 2017.07.17 දින සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනීසිට ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ලියවිලි අනුව පැමිණිලිකරුවන් සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් ලබා නොමැති බවත්ය.

එමෙන්ම, ආණ්ඩුකාර ලේකම්ගේ අංක 3/31 (1) වෙළුම හා 2017.01.16 දිනැති ලිපියේ අනුමැතිය අනුව ඉංග්‍රීසි ජාතික ඩිප්ලෝමාධාරී HNDE අයදුම්කරුවන් සඳහා පමණක් උපරිම වයස් සීමාව අවුරුදු 45 දක්වා වන ලෙස සුදුසුකම් නියම කර ඇති බවද සඳහන් කර ඇත.

උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථාව අනුව උපාධිධාරීන්ගෙන් හා ඩිප්ලෝමාධාරීන්ගෙන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඒ අනුව පැවති විවෘත තරග විභාගයේ හා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුසන් තෝරා පත්වීම් ලබාදී ඇති බවත්, බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ 1.1-iii හි සාමාන්‍ය සුදුසුකම් අනුව 2017.01.23 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වීම හා 35 ට නොවැඩි විය යුතුය යන්න දක්වා ඇති බැවින් අදාළ වයස් සීමාවන් සලකා බලන ලද බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුවන් සඳහන් කරන පරිදි වයස 35 ඉක්මවූ උපාධිධාරීන් සඳහා පත්වීම් ලබාදී නොමැති බවත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිර්දේශ හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත එනම් ආණ්ඩුකාර ලේකම්ගේ අංක : 3/3/1 (1) - 1 වෙළුම හා 2017.10.16 දිනැති ලිපිය මගින් ඉංග්‍රීසි පිළිබඳ ජාතික ඩිප්ලෝමාධාරී HNDE අයදුම්කරුවන් සඳහා පමණක් උපරිම වයස් සීමාව අවුරුදු 45 ක් දක්වා වන පරිදි බඳවා ගැනීමට නියම කර ඇති බවත් සඳහන් කර ඇත.

විමර්ශනය හා නිරීක්ෂණ :-

උතුරු මැද පළාත් පාසල් වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් මගින් වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි අයගෙන් අයදුම්පත් කැඳවා ඇත.

අනතුරුව 2016.08.03 දිනැතිව දිනමිණ පුවත්පතෙහි "උතුරුමැද පළාතේ පාසල් වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා ඉංග්‍රීසි පිළිබඳජාතික ඩිප්ලෝමාධාරීන් (HNDE) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම - වයස් සීමාව සංශෝධනය කිරීම" යන මැයෙන් පළ කරන ලද දැන්වීමට අනුව 2016.05.23 දින දිනමිණ හා තිණකරන් පුවත්පත් නිවේදනය මගින් දක්වා ඇති වයස් සීමාව "ඉංග්‍රීසි පිළිබඳ ජාතික ඩිප්ලෝමාධාරීන් (HNDE) සඳහා පමණක් සංශෝධනය කර අවු. 18 ත් 45 ත් ලෙසට දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

නමුත් පිට පළාත් සභා වලට උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් කිරීම සඳහා 2016 වර්ෂයේ විවෘත තරග විභාගයට කරන ලද අයදුම්පත් කැඳවීමේදී, එම පළාත් වල උපරිම වයස් සීමාව 45 වූ බව "බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ඇති පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා සිංහල/දෙමළ උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම - 2016' මැයෙන් වන 2016.10. 31 දිනැති පුවත්පත් දැන්වීම අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව පළාත තුළ හා පිට පළාත් තුළ ඩිප්ලෝමාධාරින් (HNDE) අයදුම්පත්ලාභීන්ට ගුරු පත්වීම් ලැබී ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් තම පැමිණිලි මගින් ප්‍රධාන කොටම ප්‍රකාශ කොට ඇත්තේ, උපාධිධාරින් ගුරු පත්වීමක් ලබාගැනීම සඳහා වූ උපරිම වයස් සීමාව අවුරුදු 35 ක් ලෙස නිකුත් වූ ගැසට් නිවේදනය නැවත සංශෝධනය කිරීමේදී සියළුම උපාධිධාරින්ට පොදු වන ලෙස ගැසට් පත්‍රය සංශෝධනය නොකොට HNDE ඩිප්ලෝමාධාරින් සඳහා පමණක් වයස් සීමාව සංශෝධනය කිරීමෙන් තමන්ට අසාධාරණයක් සිදුවූ බවය.

වගඋත්තරකරුවන් කියාසිටින්නේ HNDE ඩිප්ලෝමාධාරින් සඳහා පමණක් වයස් සීමාව සංශෝධනය කිරීමෙන් පැමිණිලිකරුවන්ගේ අයිතිවාසිකම් කඩවීමක් සිදුව .නොමැති බවයි.

නමුත්, එකම පුවත්පත් දැන්වීමක් මගින් සමාන තනතුරකට බඳවා ගැනීමේදී HNDE ඩිප්ලෝමාධාරින් සඳහා පමණක් වයස් සීමාව සංශෝධනය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත සහ ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත සිදුකළ බවට දක්වා ඇතත් එසේ සංශෝධනය කිරීමට හේතුවූ සාධාරණ කරුණු දැක්වීමක් වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිවේදනයක් මගින් උතුරු මැද පළාත් පාසල් වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයේ යෝග්‍යතාවය සාමාන්‍ය සුදුසුකම් යටතේ වන වයස් සීමාවන් 2017.01.23 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය ලෙස සංශෝධනය කර ඇති නමුත් උපාධිධාරින්ගේ වයස් සීමාව වෙනස් කිරීමක් මෙම සංශෝධනය මගින් සිදුව නොමැති බව නිරීක්ෂණය වේ.

දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන අනුව එකම තනතුරකට සිදුකරනු ලබන බඳවා ගැනීමක් සඳහා උපාධියක් හා ඩිප්ලෝමාවක් වර්ගීකරණයකට ලක් කර එම වර්ගීකරණය අනුව වයස් සීමාවන් තීරණය කර එක් වර්ගීකරණයකට පමණක් විශේෂ සැලකිල්ලක් දක්වා බඳවා ගැනීම් සිදු කර ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

මෙකී සමස්ථ කරුණු අනුව. 2016 වර්ෂයේ පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා සිංහල/දෙමළ උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේදී. උතුරුමැද පළාත්වල උපාධිධාරී ගුරුවරුන් සම්බන්ධයෙන් පමණක් වයස් සීමාව අවු. 18-45 ත් අතර ලෙසට දක්වා ඇති බවට කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති බැවින් එම අයදුම්කරුවන් සම්බන්ධයෙන්ද HNDE ඩිප්ලෝමාධාරීන් සඳහා සහ වෙනත් පළාත්වල උපාධිධාරීන් (බස්නාහිර) සම්බන්ධයෙන් සලකා බලන ලද වයස් සීමාව වන අවු. 18-45 සීමාව සලකා බලා කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.02.05 වන දිනට පෙර මෙකී නිර්දේශය පරිදි කටයුතු කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/